# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණිය තනතුරට පළාත් කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය-2026

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණිය තනතුරට පළාත් කුසලතා පදනම මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.03.06** දින වේ. මෙම තරඟ විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, මෙම නිවේදනයේ සඳහන් නැගෙනහිර පළාතේ නගර හතරකදී නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**2. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි :-**

**2.1.** මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

**2.2.** මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයෙන් ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයක් මගින් පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

**2.3.** මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු දහයක (10) අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුවේ.

**2.4.** ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති දැනටමත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවා නියුක්ත වූවන් ඔවුනගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේම අයදුම්කරු මෙම තනතුරු සඳහා තේරී පත්වුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟතාවය පළ කල යුතුය. මෙම තනතුරු සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය නොමැතිව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවෙකු තෝරා ගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**3. යෝග්‍යතා ඃ-**

**3.1. සාමාන්‍ය සුදුසුකම්**

**3.1.1.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

**3.1.2.** යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

**3.1.3.** **2026.03.06** වන දිනට වයස අවුරුදු **18** ට නොඅඩු සහ වයස අවුරුදු **35** ට නොවැඩි විය යුතුය.

**3.1.4.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

**හෝ**

**3.1.5.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් අවම වශයෙන් අවුරුදු තුනක්වත් (03) අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි ස්ථිරව පදිංචි වී සිටින අයෙකු සමඟ ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතේ අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර පදිංචිය මාරු කරගෙන පැමිණ ඒ බව සනාථ කිරීමට ලේඛන ඉදිරිපත් කළ හැකි අයෙකු විය යුතුය.

සටහනඃ **ඉහත 3.1.4 යටතේ අයදුම්කරන අපේක්ෂකයින් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් පදිංචිය සනාථ කිරීමට ආසන්න අඛණ්ඩ වසර 03 ක් සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු අතර, ඉහත 3.1.5 යටතේ අයදුම්කරන අපේක්ෂකයින් තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය සහ තම කලත්‍රයාගේ පදිංචිය සනාථ කිරීමට ආසන්න වසර 03 ක් සඳහා ලබාගත් ඡන්දහිමි නාමලේඛනයේ සහතික කරන ලද උපුටනය සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකයද සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.**

**3.1.6.** කිසිඳු ආගමික නිකායක පැවිදි වූ කිසිඳු පුද්ගලයෙකු විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

**3.2. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

| තනතුරු නාමය | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| **කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය** | **3.2.1.** සිංහල භාෂාව/ දෙමළ භාෂාව/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් (සම්මාන සාමාර්ථ 04) සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>**හෝ**<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තෘතියික හෝ තාක්ෂණික ආයතයකින් ලබාගත් 3 වන මට්ටමේ (NVQ Level 3) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br><br>**3.2.2.** විද්‍යා/ගණිත/තාක්ෂණ විෂය ධාරාවන් යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) එකම වරකදී සමත් ව තිබිය යුතුය. මෙයට සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂිකර්මය හෝ ජීව විද්‍යාව යන විෂයන්ගෙන් අවම විෂයන් 02 ක් ඇතුළත් විය යුතුය.<br>**හෝ**<br>ඉහත **3.2.2.** ඡේදයේ සඳහන් විෂයන් නොවන වෙනත් විෂයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකම වරක දී සමත්ව තිබිය යුතු අතර, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් තාක්ෂණික විද්‍යාලයකින් අදාළ තනතුරට, අදාළ ක්ෂේත්‍රයකින් ජාතික තාක්ෂණික සහතිකය (NCT) ලබා තිබිය යුතුය. ( උදා:සිවිල්/විදුලි/යාන්ත්‍රික තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික සහතිකය)<br>**හෝ**<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තෘතියික හෝ තාක්ෂණික ආයතයකින් ලබාගත් 4 වන මට්ටමේ (NVQ Level 4) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබා තිබීම. | i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව.<br>**හෝ**<br>ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව.<br>**හෝ**<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව.<br>**හෝ**<br>iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.<br>**හෝ**<br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>**හෝ**<br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>**හෝ**<br>vii. ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| | | |
|---|---|---|
| **කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය** | **3.2.3.** සිංහල භාෂාව/ දෙමළ භාෂාව/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් (සම්මාන සාමාර්ථ 04) සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**හෝ**<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තෘතියික හෝ තාක්ෂණික ආයතයකින් ලබාගත් 3 වන මට්ටමේ (NVQ Level 3) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබා තිබීම.<br><br>**සහ**<br>**3.2.4.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් (03)ක් එකම වාරයක දී සමත්ව තිබිය යුතුය.<br><br>**හෝ**<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තෘතියික හෝ තාක්ෂණික ආයතයකින් ලබාගත් 4 වන මට්ටමේ (NVQ Level 4) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් ලබා තිබීම. | i. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික විද්‍යාලයකින්, තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික තාක්ෂණික සහතිකය (NCT) ලබා තිබිය යුතුය.<br>( උදා:සිවිල්/විදුලි/යාන්ත්‍රික තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණික සහතිකය)<br><br>**හෝ**<br>**ii.** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික විද්‍යාලයකින්, සැලසුම් ශිල්පය (Draftsman) පිළිබඳ වසරක පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව නිම කර අදාළ සහතිකය ලබා තිබිය යුතුය.<br><br>**හෝ**<br>**iii.** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික විද්‍යාලයකින්, තනතුරට අදාළ ක්ෂේත්‍රයක කාර්මික තාක්ෂණවේදීන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව (National Certificate Course for Industrial Technicians) නිම කර අදාළ සහතිකය ලබා තිබිය යුතුය.<br><br>**හෝ**<br>iv. ඉහත සඳහන් කරන ලද තාක්ෂණික සුදුසුකම්වලට සෑම අතින්ම සමාන බවට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ වෙනත් ඕනෑම තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම. |

**4. බඳවා ගැනීමේ ක්‍රමය :-**

**4.1.** මෙම තනතුරු සඳහා නැගෙනහිර පළාත් සභාව තුල අනුමත බඳවා ගැනීමේ පරිපාටියටද රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි සඳහන් විධිවිධානවලටද අනුකූලව බඳවා ගැනීම සිදුකරනු ලැබේ. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එහිදී මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණයේදී හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකරනු නොලැබේ.

**4.2.** සෑම අයදුම්කරුවකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාල පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**4.3.** ලිඛිත විභාගයෙන් සමත් සහ සම්මුඛ පරීක්ෂණයේදී බඳවාගැනීමේ සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. මෙම තනතුරුවලට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 10/2025 අනුව MN 3-2025 දරණ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු.52,250-10x800-11x1,190-10x1,320-10x1,350-100,040/- වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයෙහි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 10/2025 අනුව, VI වන උපලේඛනයෙ හි නියම කර ඇති පරිදි පුහුණු ශ්‍රේණිය සඳහා දීමනාව ලෙස රු.43, 274/- මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

**4.4.** පවත්නා පුරප්පාඩු වලින් 70% ක් විවෘත තරග විභාගයෙන්ද, 30% ක් සීමිත තරග විභාගයෙන්ද පුරවනු ලැබේ. සීමිත තරග විභාගයෙන් පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් එම ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාවද විවෘත පදනමෙන් පුරවනු ලැබේ.

**4.5.** තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය සඳහා සෘජුව බඳවා ගැනීම සහ පුහුණු මට්ටම යටතේ බඳවා ගැනීම යන ක්‍රම දෙකම පවතින අවස්ථාවල දී ප්‍රමුඛතාවය ලබා දෙන්නේ III ශ්‍රේණිය සඳහා වන සෘජු පත්වීම්වලටය. එලෙස බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී පමණක්, ඉතිරි පුරප්පාඩු සඳහා නිර්දේශිත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු ශ්‍රේණිය යටතේ බඳවා ගනු ලැබේ.

**4.6.** විවෘත තරග විභාග පදනම මත පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා ලද අයදුම්කරුවන්, බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව තම පුහුණු කාලය සාර්ථකව නිම කළ යුතුය. ඉන් අනතුරුව පවත්වනු ලබන විභාගයෙන් සමත් වී ඇති බව තහවුරු කරමින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු ඔවුන්ට තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ පත්වීම ලබා දෙනු ඇත.
පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් අසමත්වන අභ්‍යාසලාභීන් සඳහා ඔවුන්ගේ පුහුණු කාලය මාස හයකට (06) නොවැඩි කාලයකට දීර්ඝ කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. එසේ දීර්ඝ කරන ලද පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් ද අසමත්වන විවෘත තරග විභාගය යටතේ බඳවාගත් අයදුම්කරුවන්ගේ සේවය අවසන් කරනු ලැබේ. සීමිත තරග විභාගය යටතේ බඳවා ගත් අයදුම්කරුවන් (දැනටමත් සේවයේ සිටින අය) නැවතත් ඔවුන්ගේ පෙර පැවති තනතුරු වෙත මුදා හරිනු ලැබේ.

**5. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

**5.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 4.2 දක්වා පළමු පිටුවටද, අංක 4.3 සිට 10.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**5.2. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත්, ලදුපතේ මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**5.3.** අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 854,880.00 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

**5.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.03.06** වන දිනට හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
නැගෙනහිර පළාත,<br>
කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය

**5.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/26/01, "නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණිය තනතුරට පළාත් කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2026"** ලෙස සඳහන් කළ යුතුය.

**5.6.** මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**6. විභාගයට පෙනී සිටීම ඃ-**

**6.1.** ප්‍රවේශ පත්‍රයක් ලද විභාග අපේක්ෂකයකු තම ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය.

**6.2.** සෑම විභාග අපේක්ෂකයකුම මෙම දැන්වීමේ **5.3** හි සඳහන් පරිදි ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගත යුතුය. අත්සන සහතික කරගැනීමකින් තොරව විභාගයට පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

**6.3.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයාට සිදුවනු ඇත.

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ සැපයිය යුතු තොරතුරක් හිතාමතා සැපයීම පැහැර හැර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට හෝ ඔහුට/ඇයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පිළිවන.

**9. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය ඃ-**

**9.1. ලිඛිත විභාගය**

මෙම විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය | මුළු ලකුණු | කාලය | සමත් ලකුණු |
|---|---|---|---|
| I. බුද්ධි පරීක්ෂණය | 100 යි | පැය 01 යි | 40% |
| II. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 යි | පැය 02 යි | 40% |

**බුද්ධි පරීක්ෂණය**

මෙම ප්‍රශ්න පත්‍රය, අපේක්ෂකයාගේ නිර්මාණශීලි කුසලතාවය, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය සහ ගැටලු විසඳීම පිළිබඳ විනිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබයි.

**විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය**

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබයි.

i. මූලික ඉදිකිරීම් සහ නඩත්තුව
ii. ජල සැපයුම සහ ජලාපවහනය
iii. වැඩබිම් කළමනාකරණය පිළිබඳ දැනුම
iv. ප්‍රමාණ සමීක්ෂණය (Quantity Surveying)

**9.2.** විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යවනු ලබේ.

**10. විභාග ගාස්තු ඃ-**

විභාග ගාස්තුව රු. 1000/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපතෙහි මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.) කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**11.** විභාගය පැවැත්වීම සඳහා යෝජිත ප්‍රධාන නගර හා එහි අංකයන් පහත සඳහන් වේ.

| **නගරය** | **නගර අංකය** | **නගරය** | **නගර අංකය** |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 01 | අම්පාර | 03 |
| මඩකලපුව | 02 | කල්මුණේ | 04 |

සැ.යු. **යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

**12.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**13.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**14.** මම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

ජේ. ලියාකත් අලි,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත
11.02.2026

**EX/Rec/26/01**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය හා පුහුණු ශ්‍රේණිය තනතුරට පළාත් කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2026**

**විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය**
සිංහල - S දෙමළ - T
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)*

**විභාගයට ඉදිරිපත් වන නගරයේ අංකය**
*(11 වැනි ඡේදයේ සඳහන් නගර අංකය ලියන්න.)*

**තනතුර**
*(අදාළ කොටුව තුළ '√' යොදන්න.)*

**ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය** : ………………………

| | |
|---|---|
| කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය | |
| කාර්මික නිලධාරි පුහුණු ශ්‍රේණිය | |

**1.0** 1.1 මුලකුරු සමඟ නම : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : Mr. PERERA, A.B.C.)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………
*(සිංහලෙන්/දෙමළෙන්)* ……………………………………………………………

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ……………………………………………………………

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

2.2 ස්ථිර ලිපිනය : ……………………………………………………………
*(සිංහලෙන්/දෙමළෙන්)* ……………………………………………………………

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ……………………………………………………………
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ……………………………………………………………

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය :

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 **2026.03.06** දිනට වයස : වර්ෂ මාස දින

**4.0** අධ්‍යාපන සුදුසුකම්

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ………………………………………
(ii) විභාග අංකය : ………………………………………
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ………………………………………
(ii) විභාග අංකය : ………………………………………
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

4.3 වෙනත් සුදුසුකම්

(i) ආයතනයේ නම : ……………………………………………………………………………………

(ii) සුදුසුකම : ……………………………………………………………………………………

(iii) සුදුසුකම වලංගු වන දිනය: ……………………………………………………

4.4 වෘත්තීය සුදුසුකම්

(i) ආයතනයේ නම : ……………………………………………………………………………………

(ii) ඩිප්ලෝමාව/සුදුසුකම : ……………………………………………………………………………

(iii) ඩිප්ලෝමා සහතිකය/ සුදුසුකම වලංගු වන දිනය: ……………………………………………………

**5.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :……………………………………………………………………………………………

**6.0** රාජ්‍ය/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

6.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : ……………………………………………………
6.2 වර්තමාන තනතුර : ……………………………………………………
6.3 මුල්පත්වීම් දිනය : ……………………………………………………
6.4 වර්තමාන තනතුරෙහි ස්ථිර කළ දිනය : ……………………………………………………

**7.0** විභාග ගාස්තු ගෙවූ (පැහැදිලි විස්තර සහිත) ලදුපත අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**8.0 අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකග වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.
(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………………… ………………………………
අයදුම්කරුගේ අත්සන

**9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 5.3 අනුව)*
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………………………………………………මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ………………………දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

………………………………………
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ………………………………
සහතික කරන්නාගේ නම : ………………………………
තනතුර : ………………………………
ලිපිනය : ………………………………
*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

**10.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** *(රජයේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි)*
මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියකු වශයෙන් සේවය කරන ------------------------------------------ මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට සිටින සේවයෙන් නිදහස් කල හැකි බවත් ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

………………………………………
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ……………………………………………
නම : ……………………………………………
තනතුර : ……………………………………………
ලිපිනය : ……………………………………………
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.